# මාසික

# විවරණිකාව

**2013 ජූලි**



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

63 වැනි වෙළුම 07 වැනි කලාපය

**2013 ජූලි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශයː ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

# පටුන

*පිටුව*


| | | |
|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් | ..... | 05 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන - 2013 ජූලි | ..... | 06 |

| | | |
|---|---|---|
| 1. 2013 මැයි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය | ..... | 06 |
| 2. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 ජූලි | ..... | 10 |
| 3. බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් සිය ණය සහ අත්තිකාරම් මත අය කරනු ලබන දඩ පොලී අනුපාතයට මහ බැංකුව සීමාවක් පනවයි. | ..... | 12 |
| 4. 2013 ජූලි මාසයේ දී උද්ධමනය පහළ වැටෙයි | ..... | 13 |
| 5. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2011, 2012 සහ 2013 | ..... | 14 |

## 1 වන කොටස

# මාසික සිදුවීම්

## 2013 ජූලි

**රාජ්‍ය මූල්‍ය අංශය**

- වාහන ටයර් (බස් රථ සඳහා වන ටයර් හැර), වාහන අමතර කොටස්, මධ්‍යසාර, දුම්කොළ නිෂ්පාදන සහ කිරි නිෂ්පාදන (බටර් ඇතුළුව) සඳහා ආනයන බදු වැඩි කරන ලදී.
- දුම්කොළ, දුම්වැටි, මධ්‍යසාර, එතිල් මධ්‍යසාර සහ මෝටර්රථ සඳහා නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.

**ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලෙන් ලද ණය**

කොළඹ අධිවේගී මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2013 ජූනි මස 10 වන දින එ.ජ.ඩොලර් මිලියන 50 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 6.3 ක) ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 4.60 පොලී අනුපාතිකයක් අදාළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 20 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**නෙදර්ලන්තයේ ජාත්‍යන්තර රබෝ බැංකුවෙන් (Rabo Bank) ලද ණය**

සෞඛ්‍ය අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන රුධිර පරිවහණ සේවාව සඳහා වන ලේ බැංකු පද්ධතිය ඉදිකිරීම සහ සංවර්ධනය සඳහා 2013 ජූනි මස 14 වැනි දින යුරෝ මිලියන 18.5 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 3.2 ක) ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ නෙදර්ලන්තයේ ජාත්‍යන්තර රබෝ බැංකුව (Rabo Bank) අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 4.65 ක පොලී අනුපාතිකයක් අදාළ වේ. වසර 3.5 ක සහන කාලයකට යටත්ව වසර 13.5 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**එක්සත් රාජධානියේ හොංකොං සහ ෂැංහයි බැංකුවෙන් (HSBC) ලද ණය**

ප්‍රාදේශීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ II අදියර මූල්‍යනය කිරීම සඳහා 2013 ජූනි මස 21 වන දින එ.ජ.ඩොලර් මිලියන 60.1 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 7.7 ක) ණය මුදල සඳහා ශ්‍රී ලංකා රජය සහ HSBC අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය මත වාර්ෂිකව සියයට 2 ක පොලී අනුපාතිකයක් අදාළ වේ. වසර 4 ක සහන කාලයකට යටත්ව වසර 14 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**කොළඹ හොංකොං සහ ෂැංහයි බැංකුවෙන් (HSBC) ලද ණය**

ප්‍රාදේශීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ II වන අදියර මූල්‍යනය කිරීම සඳහා 2013 ජූනි මස 21 වන දින එ.ජ.ඩොලර් මිලියන 10.6 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.4 ක) ණය මුදල සඳහා ශ්‍රී ලංකා රජය සහ HSBC අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය මත වාර්ෂිකව සියයට 4 ක පොලී අනුපාතිකයක් ද, වාර්ෂිකව සියයට 0.25 ක අනිවාර්ය ගෙවීමක් ද, සැකසුම් ගාස්තුවක් ද අදාළ වේ. වසර 1 ක සහන කාලයකට යටත්ව වසර 5.5 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

## II වන කොටස
# පුවත්පත් නිවේදන
## 2013 ජූලි

### 1. 2013 මැයි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණය**

ගෙවුම් තුලනයේ ජංගම ගිණුම සහ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ප්‍රවාහ ඉහළ යාමත් සමග ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් ස්ථාවරව පැවතුණි. ජංගම ගිණුම තවදුරටත් ශක්තිමත් කරමින් සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලෙස ලැබුණු ජංගම සංක්‍රාම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ යාම පිළිබිඹු කරමින් කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත විදේශීය ආයෝජන ලැබීම් ඉහළ ගියේය. සාර්ව ආර්ථික පරිසරයේ ස්ථායීතාව සහ විනිමය පාලන රෙගුලාසි තවදුරටත් ලිහිල් කිරීම හේතුවෙන් වාණිජ බැංකු සහ සංස්ථාපිත සමාගම්වලට මේ වසරේ දී ඉහළ විදේශ ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි විය. ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල්හි පවතින අස්ථාවරභාවය හමුවේ වුවද වසරේ පළමු මාස පහ තුළ දී රාජ්‍ය සුරැකුම්පත් සඳහා ලැබුණු විදේශ ආයෝජන ඉහළ වර්ධනයක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ වෙළෙඳ ගිණුම**

2013 අප්‍රේල් මාසයේ දී වෙළෙඳ ශේෂයේ හිඟයෙහි පැවති වර්ධනයට ප්‍රතිවිරුද්ධව යමින් 2013 මැයි මාසයේ දී වෙළෙඳ හිඟය පෙර වසරේ එම කාලයට සාපේක්ෂව සියයට 1.8 කින් අඩු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට වෙළෙඳ ශේෂයේ හිඟය හයවන මාසයටත් අඛණ්ඩව අඩු විය.

2013 මැයි මාසයේ දී ආනයන වියදම පසුගිය වසරේ එම මාසයට සාපේක්ෂව සියයට 1.7 ක මධ්‍යස්ථ අගයකින් අඩු විය. ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ප්‍රවාහන උපකරණ, මූල ලෝහ, පොහොර, රථවාහන සහ කිරි නිෂ්පාදන සඳහා වූ ආනයන වියදම සැලකිය යුතු ලෙස අඩු වුවද එම අඩුවීමේ බලපෑම යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, තිරිඟු, රත්‍රං සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආදිය සඳහා වූ ආනයන වියදම වැඩිවීමෙන් සමනය විය. මුළු ආනයන වියදමෙන් ආසන්න වශයෙන් 1/4 ක් පමණ සඳහා දායකත්වයක් ලබාදෙන ඉන්ධන ආනයන වියදම 2013 මැයි මාසයේ දී සියයට 14.1 කින් අඩු වූ අතර, මුළු ආනයන වියදමෙන් සියයට 10 ක් ඉක්මවා පවතින රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම සියයට 18.4 කින් අඩු විය. මේ අතර ලෝක වෙළෙඳපොළෙහි රත්‍රං මිල අඩුවීම සමග රත්‍රං ආනයනය 2013 මැයි මාසයේ දී සියයට 44.4 කින් වර්ධනය විය. ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා වන ආයෝජන පුළුල් වීම පිළිබිඹු කරමින් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පිළිවෙළින් සියයට 32.4 කින් සහ සියයට 21.1 කින් වර්ධනය විය. ඒ අතරම ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම අඩුවීමත් සමග පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 0.7 කින් සුළු වශයෙන් අඩු විය.

2013 මැයි මාසයේ දී කාර්මික නිෂ්පාදන අපනයන ආදායම ඉහළ ගිය නමුත් කෘෂිකාර්මික අපනයන ආදායම අඩුවීම හේතුවෙන් සමස්ත අපනයන ආදායම සියයට 1.5 කින් සුළු වශයෙන් අඩු විය. සමස්ත අපනයනයන්ගෙන් සියයට 40 ක් පමණ වන රෙදිපිළි නිෂ්පාදන අපනයන ආදායම 2013 මැයි මාසයේ දී සියයට 2.1 කින් ඉහළ යාම තුළින් සමස්ත අපනයන ආදායම යහපත් මට්ටමක පවත්වාගෙන යාමට උපකාරී විය. ප්‍රවාහන උපකරණ අපනයන ආදායම ඊට පෙර මාසයේ දී මෙන්ම 2013 මැයි මාසයේ දී ද සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර,

ඛනිජ තෙල් නිෂ්පාදන අපනයනයන් ද වර්ධනය විය. කෙසේ වෙතත් ලෝක වෙළෙඳපොළෙහි රත්‍රං මිල අඩුවීම යම්තාක් දුරකට පෙන්නුම් කරමින් මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම 2013 මැයි මාසයේ දී සියයට 40.5 කින් අඩු විය. අපනයන ආදායම අඩුවීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ අනෙකුත් කාර්මික අපනයනයන් අතර ආහාර, පාන සහ දුම්කොළ හා රබර් ආශ්‍රිත නිෂ්පාදන ඇතුළත් විය. බොහෝ කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි අපනයන ආදායම අඩුවීම නිසා සමස්ත කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන ආදායම සියයට 6.8 කින් අඩු විය. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි තේ සඳහා හිතකර මිලක් පැවතිය ද අපනයන පරිමාව අඩුවීම හේතුවෙන් තේ අපනයන ආදායම අඩු විය. 2013 මැයි මාසයේ දී රබර් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි අපනයන ආදායම ද අඩු විය. කෙසේ වෙතත් මුහුදු ආහාර සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම 2013 මැයි මාසයේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

සමුච්චිත අගයන් සැලකීමේ දී 2013 වසරේ මුල් මාස පහ තුළ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලය හා සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 7,581 දක්වා සියයට 9.4 කින් ද අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 3,854 ක් දක්වා සියයට 6.6 කින් ද අඩු විය. ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 784 කින් පමණ සහ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 270 කින් පමණ අඩුවීම නිසා පෙර වසරේ අනුරූප කාලය හා සැසඳීමේ දී මෙම වසරේ මුල් මාස පහ තුළ වෙළෙඳ ශේෂයෙහි හිඟය එ.ජ.ඩොලර් මිලියන 3,727 ක් දක්වා සියයට 12.1 කින් අඩු විය.

**ගෙවුම් තුලනයේ සේවා ගිණුම යටතේ වන සංචාරක ඉපැයීම්**

2013 මැයි මස අවසානය වන විට සංචාරකයින් 438,653 ක් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් වූ අතර, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී මුළු සංචාරක පැමිණීම් සියයට 13.2 ක වර්ධනයක් පෙන්නුම් කළේය. 2012 මැයි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 57 ක් වූ සංචාරක ඉපැයීම් සමග සැසඳීමේ දී 2013 මැයි මාසයේ දී සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 77 ක් දක්වා සියයට 34.5 ක හිතකර වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම වර්ධනයට හේතු වූයේ 2013 මැයි මාසයේ දී සංචාරක පැමිණීම් සැලකිය යුතු ලෙස ඉහළ යාමයි. 2013 මැයි මාසයේ දී සංචාරකයන් 70,026 ක් පැමිණි අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව සියයට 21.8 ක වර්ධනයකි. 2012 පළමු මාස පහ තුළ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 397.1 සමග සැසඳීමේ දී, 2013 වසරේ පළමු මාස පහ තුළ දී මුළු සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 484.3 ක් දක්වා සියයට 21.9 කින් වර්ධනය විය.

**ගෙවුම් තුලනයේ ජංගම සංක්‍රාම**

2012 මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 507 සමග සැසඳීමේ දී 2013 මැයි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 541 ක් දක්වා සියයට 6.6 කින් වර්ධනය විය. ඒ අනුව, 2013 පළමු මාස පහ තුළ දී මුළු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2012 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 2,650 ක් දක්වා සියයට 6.4 කින් වර්ධනය විය.

**ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම**

2012 වසරේ මැයි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 10.4 ක් වූ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි විදේශ ආයෝජකයන්ගේ ශුද්ධ විදේශ ලැබීම් 2013 මැයි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 38.6 ක් ලෙස වාර්තා විය. ඒ අනුව, පළමු මාස පහ තුළ වූ මුළු ශුද්ධ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 108 ක් විය. මේ අතර, 2013 පළමු මාස පහ තුළ දී වාණිජ බැංකු වෙත ලැබුණු මුළු විදේශ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 664.3 ක් ලෙස වාර්තා විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ලැබීම් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල වූ විදේශ ආයෝජනයන්, 2012 වසරේ මැයි මාසයේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 16.4 ට සාපේක්ෂව 2013 වසරේ මැයි මාසයේ දී

එ.ජ.ඩොලර් මිලියන 80.1 ක ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා කළේය. ඒ අනුව, 2012 වසරේ පළමු මාස පහ තුළ දී රාජ්‍ය සුරැකුම්පත් සඳහා සමුච්චිත ශුද්ධ ලැබීම් ලෙස වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 496 සමග සැසඳීමේදී 2013 වසරේ පළමු මාස පහ තුළ දී සමුච්චිත ශුද්ධ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 692 ක් දක්වා සියයට 39.5 කින් ඉහළ ගියේය. මේ අතර, 2012 වසරේ පළමු මාස පහ තුළ දී ලබාගත් එ.ජ.ඩොලර් මිලියන 701 ක සමග සැසඳීමේ දී 2013 මැයි මස අවසානයේ දී රජය ලබාගත් දිගුකාලීන ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 597 ක් විය.

**ජාත්‍යන්තර සංචිත**

2013 වසරේ මැයි මාසය අවසාන වනවිට, ශ්‍රී ලංකා දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 6.6 ක් විය. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සඳහා වූ ණය ආපසු ගෙවීම් එ.ජ.ඩොලර් මිලියන 222.5 ක්, විදේශ ණය සේවාකරණ ගෙවීම් එ.ජ.ඩොලර් මිලියන 575 ක් සහ විදේශ විනිමය අනුපාතයේ වෙනස්වීම් හා රත්‍රං මිල විශාල ලෙස පහළයාම හේතුවෙන් වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 312 ක තක්සේරු අලාභ ආදී 2013 පළමු මාස පහ තුළ වාර්තා වූ විදේශ විනිමය ගලායෑම් හමුවේ වුවද, ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත සතුටුදායක මට්ටමක පැවතුණි. වාණිජ බැංකුවල විදේශීය වත්කම් ද ඇතුලත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය 2013 වසරේ මැයි මාසය අවසාන වනවිට එ.ජ.ඩොලර් බිලියන 8.2 ක් විය. විදේශීය සංචිතයන්හි හිතකර තත්ත්වය පෙන්නුම් කරමින් විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2013 වසරේ මැයි මස අවසාන වනවිට දී පැවැති දළ නිල සංචිත සහ මුළු විදේශීය සංචිත ප්‍රමාණය පිළිවෙලින් ආනයනික මාස 4.3 කට සහ 5.4 ක ට සමාන විය.

**විනිමය අනුපාතිකයේ හැසිරීම**

අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව වසර තුළ දී මේ දක්වා අධිප්‍රමාණය විය. 2012 වසර අග සිට 2013 ජූලි 17 දක්වා කාලපරිච්ඡේදය තුළදී රුපියල ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 3.2 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 11.8 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 5.7 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 9.4 කින් ද, අධිප්‍රමාණය විය. මේ අතර, වසර පුරා එ.ජ.ඩොලරයට එරෙහිව ස්ථාවර මට්ටමක පැවති රුපියල, මෑතකාලීනව තාවකාලිකව අවප්‍රමාණය විය. ආනයනකරුවන්ගේ ඉහළ ඉල්ලුමෙහි ප්‍රතිඵලයක් ලෙස 2013 ජූනි මස දෙවන සතියේ සිට රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව අවප්‍රමාණය විය. 2012 වසර අග සිට 2013 ජූලි 17 දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල සියයට 3.2 කින් ද යුරෝවලට එරෙහිව රුපියල සියයට 1.9 කින් ද අවප්‍රමාණය විය. කෙසේ වුවත්, පසුගිය දින කිහිපය තුළ එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල ස්ථාවර වන ලකුණු පෙන්නුම් කළේය.

## සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - මැයි 2013 (අ)

| කාණ්ඩය | 2012 මැයි එ.ජ.ඩො. මිලියන | 2013 මැයි එ.ජ.ඩො. මිලියන | මැයි වර්ධනය (සියයට) | 2012 ජන - මැයි එ.ජ.ඩො. මිලියන | 2013 ජන - මැයි එ.ජ.ඩො. මිලියන | ජන - මැයි වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | **806.0** | **793.9** | **-1.5** | **4,123.9** | **3,853.6** | **-6.6** |
| මෙයින්, | | | | | | |
| **කෘෂිකාර්මික** | **212.4** | **197.9** | **-6.8** | **965.0** | **924.7** | **-4.2** |
| මෙයින්, තේ | 139.7 | 128.2 | -8.3 | 580.6 | 568.1 | -2.2 |
| **කාර්මික** | **590.7** | **592.8** | **0.4** | **3,127.8** | **2,915.7** | **-6.8** |
| මෙයින්, රෙදිපිළි හා ඇඟළුම් | 312.3 | 318.9 | 2.1 | 1,671.6 | 1,643.9 | -1.7 |
| රබර් නිෂ්පාදිත | 74.0 | 68.0 | -8.0 | 369.5 | 328.2 | -11.2 |
| ආහාර පාන හා දුම්කොළ | 25.3 | 16.7 | -34.0 | 119.3 | 86.3 | -27.7 |
| **ඛනිජ ද්‍රව්‍ය** | **2.3** | **2.4** | **5.3** | **26.6** | **8.3** | **-68.6** |
| ආනයන | **1,575.0** | **1,548.8** | **-1.7** | **8,364.7** | **7,581.1** | **-9.4** |
| මෙයින්, | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **268.5** | **266.6** | **-0.7** | **1,392.6** | **1,250.5** | **-10.2** |
| මෙයින්, ආහාර හා පාන වර්ග | 119.0 | 127.0 | 6.7 | 585.5 | 583.8 | -0.3 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 149.5 | 139.6 | -6.6 | 807.0 | 666.7 | -17.4 |
| **අන්තර් භාණ්ඩ** | **972.5** | **907.2** | **-6.7** | **4,957.8** | **4,431.9** | **-10.6** |
| මෙයින්, ඛනිජ තෙල් | 376.6 | 323.3 | -14.1 | 2,291.6 | 1,764.3 | **-23.0** |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 194.5 | 158.6 | -18.4 | 908.8 | 809.0 | -11.0 |
| **ආයෝජන භාණ්ඩ** | **331.9** | **373.7** | **12.6** | **1,999.9** | **1,893.7** | **-5.3** |
| මෙයින්, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 164.5 | 217.8 | 32.4 | 924.3 | 996.4 | 7.8 |
| ප්‍රවාහන උපකරණ | 73.4 | 41.5 | -43.5 | 559.3 | 289.4 | -48.3 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 93.7 | 113.5 | 21.1 | 514.5 | 605.3 | 17.6 |
| **වෙළෙඳ ශේෂයේ හිඟය** | **769.1** | **754.9** | **-1.8** | **4,240.8** | **3,727.5** | **-12.1** |
| **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** | **507.1** | **540.8** | **6.6** | **2,490.0** | **2650.0** | **6.4** |
| **විවිධ ආයෝජන (ශුද්ධ)** | **10.4** | **38.6** | | **181.9** | **108.0** | |
| **සංචාරක ඉපැයීම්** | **57.3** | **77.0** | **34.5** | **397.1** | **484.3** | **21.9** |
| **වාණිජ බැංකු වෙත ලැබීම් (ආ)** | | | | | **664.3** | |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ)** | **276.2** | **175.4** | **-36.5** | **1,814.2** | **2,311.2** | **27.4** |
| මෙයින්, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 120.8 | 125.8 | 4.2 | 1,093.8 | 1,707.7 | 56.1 |
| දිගු කාලීන ණය | 152.5 | 49.5 | -67.5 | 700.6 | 596.6 | -14.8 |

(අ) තාවකාලික

(ආ) 2012 වසර තුළ දී වාණිජ බැංකු විසින් ලබාගත් දිගුකාලීන විදේශ ණය එ.ජ.ඩොලර් මිලියන 973 ක් විය.

(ඇ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

## 2. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 ජූලි

*වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය 2013 මැයි මාසයේ පැවති සියයට 7.3 සිට 2013 ජූනි මාසයේ දී සියයට 6.8 දක්වා අඩු විය. මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) එය හඳුන්වාදීමෙන් පසුව පැවති අවම අගය වාර්තා කරමින් 2013 ජූනි මාසයේ දී තවදුරටත් අඩු විය.*

මූලික උද්ධමනය 2013 මැයි මස පැවති සියයට 5.7 සිට 2013 ජූනි මාසයේ දී සියයට 4.3 දක්වා අඩු විය. හිතකර උද්ධමන අපේක්ෂාවන් පැවතීම, සැපයුම් අංශයේ වැඩිදියුණුවීම් සහ ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනාත්මක පීඩනයන් නොමැති වීම නිසා වසරේ ඉතිරි කාලසීමාව තුළ දී උද්ධමනය අවම ඍතුමය විචලනයන්ට යටත්ව තනි අංකයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතරම, මෑතකදී ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව පදනම් අංක 200 කින් අඩු කිරීම, 2012 දෙසැම්බර් මාසයේ සිට ආරම්භ කරන ලද මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාවලියට තවදුරටත් ආයකත්වය සැපයූ අතරම එය ආර්ථික වර්ධන ගම්‍යතාවයට උපකාරීවීම සඳහා මූල්‍ය වෙළෙඳපොළ වෙත තවදුරටත් උත්තේජකයන් ලබා දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතික මෙන්ම ප්‍රධාන වාණිජ බැංකුවල කෙටිකාලීන ණය පොලී අනුපාතික සහ තැන්පතු පොලී අනුපාතිකවල පහළ යාමක් දක්නට ලැබුණි. පෞද්ගලික අංශයට ලබාදෙන දිගුකාලීන ණය පහසුකම් සඳහා වන පොලී අනුපාතික ද ඉදිරි මාසවලදී අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වර්තන ගිණුම වෙත වූ ලැබීම් මෙන්ම රජයේ සුරැකුම්පත්වල විදේශීය ආයෝජන, වාණිජ බැංකු සහ කොටස් වෙළෙඳපොළ වෙත වූ ලැබීම් ඉහළ යාම විදේශීය අංශයේ ස්ථායීතාව වර්ධනය කිරීමට උපකාරී විය. මීට අමතරව, රටෙහි ශක්තිමත් ආර්ථික අපේක්ෂාවන්ට මගපෙන්වමින් වෙළෙඳ ශේෂය තවදුරටත් අඩු වූ අතර දේශීය වෙළෙඳාමද වර්ධනය වීමේ සලකුණු පෙන්නුම් කරන ලදී. කෙසේවෙතත්, සංශෝධනය කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගෝලීය ආර්ථික පෙරදැක්මට අනුව, දියුණු ආර්ථිකයන්හි ආර්ථික ක්‍රියාකාරකම් අපේක්ෂිත මට්ටමට වඩා දුර්වල මට්ටමක පවතිනු ඇතැයි වන අපේක්ෂාවන්, විදේශ අංශයෙන් වන ඉල්ලුම අඩුවීමට බලපෑම් කළ හැකි බැවින් ඉදිරි මාසවලදී ඒ පිළිබඳව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

2012 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක වූ මුදල් ප්‍රතිපත්ති උත්තේජකයන්ට ප්‍රතිචාර දක්වමින් 2013 මැයි මාසය තුළ දී පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය වර්ධනය විය. පෞද්ගලික අංශයට ලබාදුන් ණය නිරපේක්ෂ අගය අනුව අප්‍රේල් මාසයේ පැවැති රුපියල් බිලියන 7.6 සිට 2013 මැයි මාසයේ දී රුපියල් බිලියන 18.3 කින් වර්ධනය විය. මේ අතරම, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල්හි ($M_{2b}$) වර්ධනය අප්‍රේල් මාසයේ පැවති සියයට 15.2 සිට 2013 මැයි මාසයේ දී සියයට 16.3 දක්වා ඉහළ ගියේය. අපේක්ෂිත පරිදි, 2013 මැයි මාසයේ දී රාජ්‍ය අංශයට ලබාදුන් ණය රුපියල් බිලියන 6.2 කින් පමණ අඩු විය. රාජ්‍ය අංශය වෙත වූ ණය වර්ධනය අඩුවීම සහ පියවිය යුතු ණයවලින් කොටසක් පියවීම නිසා ප්‍රධාන රාජ්‍ය සංස්ථා විසින් ණය ලබාගැනීම පහළයාම, පරිපාලිත මිල ගණන්හි සිදුකරන ලද සංශෝධනයන් නිසා ලැබුණු ආදායම ඉහළයාම මෙන්ම හිතකර කාලගුණික තත්ත්වයන් නිසා තාප විදුලිබලය ජනනය කිරීම සඳහා ඉන්ධන භාවිතය අඩුවීම මෙම අඩුවීම සඳහා උපකාරී විය. රාජ්‍ය අංශයෙහි කාර්යසාධනය තවදුරටත් වැඩිදියුණුවීම තුළින් පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සඳහා අමතර උත්තේජකයන් ලබාදීම සඳහා බැංකු අංශයෙන් අරමුදල් මුදාහැරීමට අපේක්ෂා කෙරේ.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, 2013 ජූලි මස 23 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් එලෙසම පවත්වා ගැනීම සුදුසුයැයි මුදල් මණ්ඩලයෙහි මතය වූ අතර ඒ අනුව, මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.00 සහ සියයට 9.00 ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ඉදිරියට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථාකාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.

### (3) බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් සිය ණය සහ අත්තිකාරම් මත අය කරනු ලබන දඩ පොලී අනුපාතයට මහ බැංකුව සීමාවක් පනවයි.

*බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් විසින් අය කරනු ලබන දඩ පොලී අනුපාතික අතිශයින්ම ඉහළ අගයක් ගන්නා බව සහ එම පොලී අනුපාතික කල් පසු වූ ණයගැතියන්ට අයුතු බර පැටවීමක් බවට පත්වන බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. තවද, මෙවැනි ඉහළ පොලී අනුපාතිකයන් රට තුළ ව්‍යවසායකත්වය දියුණු වීමේ හැකියාව වලක්වයි.*

එවැනි ඉහළ පොලී අනුපාතික හේතුවෙන් ණයගැතියන්ට ණය ආපසු ගෙවීමට නොහැකි වීම බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම්හි මූල්‍ය තත්ත්වයට මෙන්ම මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට අහිතකර ලෙස බලපෑ හැක.

මේ සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද සමීක්ෂණයක දී හෙළි වූයේ, දැනට බැංකු විසින් අතපසු වූ හිඟ ණය සහ ඇතැම් විට මුළු හිඟ ණය ප්‍රමාණයම මත අය කරනු ලබන දඩ පොලී අනුපාතිකය, ණය මුදල මත අය කරනු ලබන මූලික පොලී අනුපාතිකයට අමතරව වසරකට සියයට 2 සිට සියයට 20 අතර පරාසයක පවතින බවයි. තවද, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් මගින් අයකරනු ලබන සාපේක්ෂ පොලී අනුපාතික වඩාත් ඉහළ අගයක් ගනී. එසේම, බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම්, කල්බදු පහසුකම් සම්බන්ධයෙන් කල් ඉක්මවූ බදු කුලී මත අය කරනු ලබන දඩ පොලී අනුපාතය, මූලික පොලී අනුපාතිකයට අමතරව වසරකට සියයට 36 සිට සියයට 48 අතර පරාසයක පවතී.

එසේ හෙයින්, මෙම තත්ත්වය, දැනට රට තුළ පවත්නා අඩු පොලී අනුපාත වාතාවරණය සහ අනෙකුත් නැගී එන ආර්ථික තුළ පවත්නා අඩු පොලී අනුපාත එනම් වසරකට සියයට 4 සිට 12 අතර පරාසයක පවතින ණය පොලී අනුපාතික සහ සාපේක්ෂව බෙහෙවින් පහත අගයක පවතින දඩ පොලී අනුපාතික, සමග නොගැලපෙන බව පැහැදිලි වේ.


ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව, 2013 අගෝස්තු 01 දින සිට බැංකු දැනට ලබා දී ඇති ණය පහසුකම් ද ඇතුලත්ව, සියලුම ණය සහ අත්තිකාරම් මත අයකරනු ලබන දඩ පොලී අනුපාතිකය, ණය නොගෙවූ කාලපරිච්ඡේදය ඇතුළත අතපසු වූ හිඟ ණය මුදලට වසරකට සියයට 2 නොඉක්මවන මට්ටමක පවත්වාගෙන යායුතු බව ද, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් විසින් අයකරනු ලබන දඩ පොලී අනුපාතිකය වසරකට සියයට 3 නොඉක්මවන මට්ටමක පවත්වාගෙන යායුතු බව ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් වෙත දන්වා ඇත.

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය වඩා ශක්තිමත් කිරීමට අමතරව, මෙම නිර්දේශ මගින්, බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් විසින් ණය දීම විචක්ෂණ සහ ඵලදායී ලෙස වර්ධනය කිරීමෙන්, මධ්‍ය සහ දිගුකාලීන සාර්ව ආර්ථික අභිප්‍රායන් හා එක් තලයක පිහිටමින් රට තුළ ආර්ථික කටයුතු වර්ධනය වීමක් අපේක්ෂා කෙරේ.

## 4. 2013 ජූලි මාසයේ දී උද්ධමනය තවදුරටත් පහළ යයි.

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පැවති සියයට 6.8 හි සිට 2013 ජූලි මාසයේ දී සියයට 6.1 දක්වා පහළ වැටිණි. උද්ධමනයේ මෙම පහළ යාම දක්නට ලැබුණේ අනුයාත දෙවන මාසය-ටයි. වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය ද පූර්ව මාසයෙහි වාර්තා කළ සියයට 8.6 හි සිට 2013 ජූලි මාසයේ දී සියයට 8.3 දක්වා පහළ වැටිණි.*

මූලික උද්ධමනය ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය යන දෙයාකාරයෙහි ම පදනම මත පිළිවෙළින් ජූනි මාසයේ පැවති සියයට 4.3 හි සහ සියයට 6.4 හි සිට 2013 ජූලි මාසයේ දී පිළිවෙළින් සියයට 3.1 සහ සියයට 6.2 දක්වා අඛණ්ඩව පහළ වැටිණි.




කො.පා.මි. දර්ශක අගය 2013 ජූනි මාසයේ පැවති 176.5 හි සිට 2013 ජූලි මාසයේ දී 176.8 දක්වා නිරපේක්ෂ වශයෙන් වැඩි වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.2 කින් ඉහළ නැගිණි. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ මිල ගණන් සියයට 0.2 කින් ඉහළ යාම දර්ශකයේ මෙම මාසික වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර කාණ්ඩය තුළ සමහර එළවළු, පළතුරු හා නැවුම් මත්ස්‍ය වර්ග, අර්තාපල්, ලොකු ළූණු, රතු ළූණු සහ දෙහි ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. කෙසේ වුව ද, බොහෝ එළවළු සහ නැවුම් මත්ස්‍ය වර්ග, අමු මිරිස් සහ බිත්තර ආදියෙහි මිල ගණන්වල පහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ, ප්‍රවාහන (සියයට 0.5 කින්); රෙදිපිළි හා පාවහන් (සියයට 0.2 කින්); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.1 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන්වල ඉහළ යාම් වාර්තා විය. මේ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සෞඛ්‍ය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

## 5. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2011, 2012 සහ 2013

(2006/07= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 |
| ජනවාරි | 149.2 | 154.8 | 170.0 | 1.4 | 0.3 | 0.8 | 6.2 | 3.8 | 9.8 | 6.1 | 6.5 | 8.1 |
| පෙබරවාරි | 151.3 | 155.4 | 170.7 | 1.4 | 0.4 | 0.4 | 7.2 | 2.7 | 9.8 | 6.1 | 6.1 | 8.6 |
| මාර්තු | 150.6 | 158.8 | 170.8 | -0.5 | 2.2 | 0.1 | 7.7 | 5.5 | 7.5 | 6.2 | 5.9 | 8.8 |
| අප්‍රේල් | 150.6 | 159.8 | 170.0 | 0.1 | 0.6 | -0.5 | 8.9 | 6.1 | 6.4 | 6.4 | 5.7 | 8.8 |
| මැයි | 151.5 | 162.1 | 173.9 | 0.6 | 1.4 | 2.3 | 8.2 | 7.0 | 7.3 | 6.6 | 5.6 | 8.8 |
| ජුනි | 151.2 | 165.2 | 176.5 | -0.2 | 1.9 | 1.5 | 7.1 | 9.3 | 6.8 | 6.7 | 5.8 | 8.6 |
| ජූලි | 151.7 | 166.7 | 176.8 | 0. 4 | 0.9 | 0.2 | 7.5 | 9.8 | 6.1 | 7.0 | 6.0 | 8.3 |
| අගෝස්තු | 151.3 | 165.7 | | -0.3 | -0.6 | | 7.0 | 9.5 | | 7.1 | 6.3 | |
| සැප්තැම්බර් | 151.7 | 165.5 | | 0.3 | -0.1 | | 6.4 | 9.1 | | 7.2 | 6.5 | |
| ඔක්තෝබර් | 151.5 | 165.0 | | -0.1 | -0.3 | | 5.1 | 8.9 | | 7.1 | 6.8 | |
| නොවැම්බර් | 152.6 | 167.1 | | 0.7 | 1.3 | | 4.7 | 9.5 | | 6.9 | 7.2 | |
| දෙසැම්බර් | 154.4 | 168.6 | | 1.2 | 0.9 | | 4.9 | 9.2 | | 6.7 | 7.6 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව